# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 37 දරන
## ජාතිය රූකගැනීමේ දයක මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජනවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි

## 1996 අංක 37 දරන ජාතිය රැක ගැනීමේ දයක මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 78/96

### 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දයක මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 37 දරන ජාතිය රැක ගැනීමේ දයක මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දයක මුදල් පනතේ දීර්ඝ නාමයෙහි යෙදෙන "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂයේ සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙලින්, 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල සෑම කාර්තුවක් සඳහා ම" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *(1996 අංක 5 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.)*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(අ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයෙහි "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන් හෝ ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iii) ශ්‍රී ලංකාවෙන් පිටත දී ඇතුළත් වූ සේවා ගිවිසුමක් අනුව, යම් ශ්‍රී ලංකා දූත මණ්ඩලයක ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත කරනු ලැබූ පුද්ගලයකු වශයෙන්".

2—ඩී 042617—7,125 (96/12)

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි යෙදෙන "1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂය" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙළින් 1996 අප්‍රේල් මස 1 වන දිනයෙන් සහ 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂවල" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.